**කරන්දෙණිය ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 20 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 21 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල 1994, 1998 සහ 2004 වර්ෂයන් සඳහා ගෙවිය යුතු රු.80,042 ක් වූ විගණන ගාස්තු සහ සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි. තවද 2009 වර්ෂයේ විගණන ගාස්තු රු.40,356 ක් 2011 වර්ෂයේ දී ගෙවා තිබුණ ද, එකී වර්ෂය සඳහා සමාලෝචිත වර්ෂයේ දී නැවතත් රු.50,000 ක ප්‍රතිපාදන සලසා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් හා වියදම් රු.50,000 කින් වැඩියෙන් දැක්විණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් මිලදී ගැනීම් රු.305,786 ක් වුවද, රු.344,117 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල පුස්තකාල පොත් ගිණුම් ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුම් ශේෂය රු.38,331 කින් වැඩියෙන් දැක්විණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල රු.3,849,522 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) සභාව විසින් පරිහරණය කරනු ලබන ඉඩම් 07 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල කර්මාන්ත 03 ක් සඳහා ලැබිය යුතු මූලධන ආධාර මුදල රු.2,896,854 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.2,985,278 ක් ලෙස ප්‍රතිපාදන සලසා තිබීමෙන් රු.88,424 කින් ණයගැතියන් හා මූලධන ආධාර වැඩියෙන් දැක්විණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල කර්මාන්ත 04 ක් සඳහා ලැබිය යුතු මූලධන ආධාර රු.720,771 ක් හා එකී කර්මාන්ත වෙනුවෙන් වියදම් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආදායම් හා වියදම් ද, ණයගැතියන් හා ණයහිමියන් ද රු.720,771 කින් අඩුවෙන් දැක්විණි.

(උ) අඹගහහන්දිය සිල් ආරාමය අසලින් ඇති කැරැකැටිය මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්ත සඳහා රු.500,000 ක වියදම් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී දෙවරක් ප්‍රතිපාදන සලසා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් හා ප්‍රාග්ධන වියදම් රු.500,000 කින් වැඩියෙන් දැක්විණි.

(ඌ) විශේෂ ව්‍යාපෘති - 2014 යටතේ රු.400,000 ක් වූ කර්මාන්ත 02 ක් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් ණයහිමියන් හා ප්‍රාග්ධන වියදම් රු.400,000 කින් අඩුවෙන් දැක්විණි.

(එ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසය සඳහා ඇල්පිටිය අධිකරණයෙන් ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.97,167 ක් වුවද, උසාවි දඩ ආදායම බිල් කිරීමේ දී රු.199,417 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම හා ණයගැතියන් රු.102,250 කින් වැඩියෙන් දැක්විණි.

(ඒ) රු.60,832 ක් වූ වරිපනම් බදු අධි ගාස්තුව, වරෙන්තු ගාස්තු හා දඩ යටතේ නොදක්වා වරිපනම් බදු ආදායම් ලෙස දක්වා තිබීමෙන්, මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු ආදායම රු.60,832 කින් වැඩියෙන් ද වරෙන්තු ගාස්තු හා දඩ ආදායම රු.60,832 කින් අඩුවෙන් ද දැක්විණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

ගිණුම් විෂයයන් 10 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.638,604 ක වෙනසක් පැවතුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.143,698,997 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, උපලේඛන, යාවත්කාලීන කරන ලද විදුලි බඩු ලේඛනය, අත්තිකාරම් ලේඛනය සහ ණය ලේඛනය පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,730,520 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,377,946 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගතයුතු රු.2,253,864 ක් වූ වරිපනම් බදු, රු.68,854 ක් වූ අක්කර බදු, රු.797,145 ක් වූ පොල බදු හා රු.123,350 ක් වූ වෙළඳ බලපත්‍ර ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ), 159(1) හා 152(4) වගන්ති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.1,424,500 ක උසාවි දඩ හා රු.14,105,186 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 බලය නොළත් ගනුදෙනු

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ) විදෙස් අධ්‍යයන චාරිකා**

ප්‍රාදේශීය සභා අරමුදල යෙදවීම පිළිබඳ නීතිමය ප්‍රතිපාදන සලසා ඇති 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියේ දැක්වෙන කාර්යයන් යටතට නොගැනෙන කාර්යයක් වූ විදේශ අධ්‍යයන චාරිකා 02 ක් සඳහා රු.378,025 ක් ප්‍රාදේශීය සභා අරමුදලින් වැයකර තිබුණි. එකී විදේශ ගමන් සඳහා විධිමත් අනුමැතියක් ද ලබාගෙන නොතිබුණි.

(ආ) උත්සව වියදම්

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය අනුව පොදු වැදගත්කමකින් යුත් කාර්යයන් පිළිබඳ උත්සව වියදම් සම්බන්ධයෙන් වර්ෂයකට මුළු එකතුව රුපියල් එක් දහසක් නොඉක්මවන පරිදි වියයුතු අතර, එය ඉක්මවන විට ඒ සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලියවිල්ලකින් ලබා ගත යුතුය. එහෙත් සභාව විසින් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන සමාලෝචිත වර්ෂයේදී රු.139,910 ක් සභා අරමුදලින් වැය කර තිබුණි.

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

**වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා නොදීම**

1988 අංක 74 දරන (සංශෝධන) පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව 2014 වර්ෂය සඳහා සභාවේ සභාපතිවරයා, උප සභාපතිවරයා සහ සභිකයින් 08 දෙනෙකු විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

**3.3** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කෙරේ.

**(අ)** **බදු ප්‍රේෂණය නොකිරීම**

2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල ඉදිකිරීම් කටයුතු හෝ සේවා සැපයීම් සඳහා ගෙවීම් කිරීමේ දී සභාව විසින් රඳවාගෙන තිබූ රු.516,718 ක් වූ නිශ්චිත බදු මුදල් සහ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ විධිවිධාන අනුව සභාවෙන් සපයනු ලබන විවිධ සේවාවන් වෙනුවෙන් අයකර ගෙන තිබූ එකතු කළ අගය මත බදු මුදල වූ රු.12,016,058 ක් විගණන දිනය වූ 2015 මාර්තු 20 දින තෙක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට යවා නොතිබුණි.

**(ආ)** **හිඟහිටි එක්වන් මුදල්**

සභාවට අයත් මහජ්දණ්ඩ හා ඌරගස්මංහන්දිය තැපැල් කාර්යාලය අසල වෙළඳ සංකීර්ණවල කඩ කාමර 05 කින් රු.592,113 ක් වූ එක්වන් මුදලක් අයකර ගෙන නොතිබුණි.

**3.4** **හඳුනාගත් අලාභ**

**ගැල්වනයිස් බට (GI PIPE) ලබාදීම**

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය විසින් 2014 නොවැම්බර් මාසය තුලදී 1 1/4" ගැල්වනයිස් බට 488 ක් සභාව වෙත ලබා දී තිබුණි.

(i) සභාව වෙත ලැබී තිබුණු ගැල්වනයිස් බට 488 ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ ඉල්ලීම පරිදි එම බටවලින් බට 100 ක් අදාළ සභාව වෙත ලබා දී තිබුණි.

(ii) සභාව සතුව ගැල්වනයිස් බට 261 ක් ද වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව සතුව බට 85 ක් ද පැවති බව 2015 අප්‍රේල් 01 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී තහවුරු විය.

(iii) මේ අනුව සභාවට ලබා දී තිබූ 1 1/4" ගැල්වනයිස් බට 488 න් බට 142 ක ඌනතාවයක් පැවතුණි. ඒ අනුව බට ඌනතාවයේ වටිනාකම රු.157,194 ක් විය.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**
---------------------------------------

**4.1 අයවැය පාලනය**
-------------------

අයවැය ලේඛනයෙහි ඇස්තමේන්තුගත සහ තථ්‍ය වශයෙන් ලැබූ ආදායම් අතර විචලනයන් පවතින බවත්, ඇතැම් වියදම් විෂයයන්වල ඉතිරි කිරීම් තිබූ බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

**4.2 පිළිතුරු නොදුන් විගණන විමසුම්**
-----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට විගණන විමසුම් 19 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළහැකි ගනුදෙනුවල වටිනාකම රු.31,419,747 ක් විය.

**5. පද්ධති හා පාලන**
---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය